පෙරට වඩා දූන් වැඩ කරන වයසේ පුද්ගලයන් සාපේක්ෂව අඩුය. පෙර සෑම විශ්‍රාමිකයෙකුට ම කම්කරුවන් පස් දෙනෙකි. වැඩිකල් යන්නට මත්තෙන් එය 2.5 දක්වා අඩු වී ඇත.

රට සඳහා ඇති එකම මාර්ගය ආර්ථික වර්ධන වේගය වේගවත් කිරීමය. එය ඉතා වේගවත් විය යුතු නැත. මීට වඩා තරමක වේගයක් ප්‍රමාණවත් වනු ඇත. එලෙස වර්ධන වේගය ඉහළ නංවාගෙන එය පවත්වාගෙන යා හැකි නම් ඊළඟ පරම්පරාව හෝ දෙක අපට වඩා පොහොසත් වනු ඇත.

මෙය වර්ධන අර්බුදයක් ලෙස හැඳින්වීම නිවැරදි වන්නේ එබැවිනි. අපට වැඩි වර්ධනයක් අවශ්‍ය මොහොතේ ම එය බිඳ වැටී ඇත. කැනඩාවේ දූනට පවත්නා අසාර්ථක ඵලදායිතාවට බොහෝ හේතු මෙන් ම බොහෝ පිළියම් ද ඇත. අපගේ දුර්වල ආයෝජන අනුපාතයන් හෙවත් දළ ස්ථාවර ප්‍රාග්ධනය ගොඩනැංවිය යුතුය. අපගේ ඵලදායිතා කාර්ය සාධනයේ භයානක පිරිහීම, කැනඩාවේ ව්‍යාපාරික ආයෝජනවල අසාමාන්‍ය සාපේක්ෂ පහත වැටීම, සමීපව නිරීක්ෂණය කරයි.

OECD, එහි සාමාජික රටවල් 38ක් සහ තවත් රටවල් නවයක් හරහා ආයෝජන නිරීක්ෂණය කරයි. 2011 සිට 2015 දක්වා කැනඩාවේ ආයෝජන වර්ධන වේගය භයානක වූවකි. එකී රටවල් 47 අතුරින් කැනඩාව සිටියේ 37 වන ස්ථානයේ ය.

2023 දී එය තවත් භයානක විය. දකුණු අප්‍රිකාව, මෙක්සිකෝව හා ජපානයට පමණක් ඉදිරියෙන් සිටිමින් 44 වන ස්ථානය දක්වා පහළ වැටුණි.

සරලව කිවහොත්, අපගේ කම්කරුවන් වෙනත් රටවල කම්කරුවනට වඩා අඩු ඵලදායිතාවක් දක්වන්නේ ඔවුන්ට වැඩ කිරීමට සිදුව ඇත්තේ අඩු ඵලදායිතාවක් යටතේ වීම නිසාය. මීට දශකයකට පමණ පෙර තරම් මෑතක දී කැනඩාවේ එක් කම්කරුවකුගේ දළ ස්ථාවර ප්‍රාග්ධනය එක්සත් ජනපදයෙන් කැපී පෙනෙන ලෙස වැඩිව තිබුණි. එහෙත් ක්‍රමයෙන් එය අඩු විය.

එබැවින් අපගේ ආයෝජන අනුපාත ඉහළ නැංවීම, පැහැදිලිවම විසඳුමේ ප්‍රධාන කොටසක් නියෝජනය කරයි. ආයෝජනය සිදු කරන්නේ කොතනක ද යන්න ද ඉතා වැදගත් කාරණයකි.

**(2024 මාර්තු 1 වන දා The Globe and Mail පුවත්පතේ ලිපියක් ඇසුරෙන් සකස් කෙරිණි. )**


# BABY SITTER

ඇමරිකාවේ
මිචිගන් ප්‍රාන්තයේ පදිංචි
ශ්‍රී ලාංකික වෛද්‍ය යුවලක් හට,
අලුත උපදින දරුවා බලා ගැනීමට
පළපුරුදු කාන්තාවක් සොයයි.
වැටුප US$1500.00
ඉඳුම්-හිටුම් සපයනු ලැබේ.
කතාකරගන්නා පරිදි
නිවාඩු ගත හැක.

පහත දුරකතන අංකයට අමතන්න:
**248 850 0860**

## Sanka Law Professional Corporation



“Cost effective legal advice in a timely manner”

- Real Estate
- Family Law
- Wills, Powers of Attorney and Estates
- Business Law
- Notary Public Services

**Sanka Wijeratne, LL.B.**
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

OFFICE
50 Nashdene Road
Unit 104
Toronto ,ON M1V 5J2
Tel: 416-494-9183
Fax 1 866 494 9389
E mail : info@sankalaw.com Web : http://www.sankalaw.com

Services are available in Sinhala, Tamil (by appointment only) and English. Evening and weekend appointments are available.